යටවත්ත ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වාලවෙළ සායන මධ්‍යස්ථානය හා පෙර පාසල සඳහා වැසිකිළි පද්ධතිය සකස් කිරීම, සභා භූමියේ ජීව වායු ඒකකයක් ස්ථාපනය කිරීම හා සභා කාර්යාලය වැඩි දියුණු කිරීම යන කර්මාන්ත 3 ක එකතු වටිනාකම වූ රු.1,064,718 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කර තිබූ ග්‍රීන් පාර්ක් ජල යෝජනා ක්‍රමයට අදාළ සංවර්ධන වියදම වූ රු.1,103,347 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) මහවෙල සහ මැදියාපොල සුනිල දිය දහර යන ජල යෝජනා ක්‍රම දෙක නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් මිලදීගෙන තිබූ ජල මෝටර් දෙකක සහ ස්ටාටර් ස්විචයක එකතු වටිනාකම වූ රු.576,235 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ 2017 ජනවාරි 3 වන දින සභාවට ලැබී තිබූ මුද්‍රණ යන්ත්‍රයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) නළ ළිං 14 ක් අළුත්වැඩියා කිරීම සඳහා මිලදීගෙන ගබඩාවේ රඳවා තිබූ ද්‍රව්‍ය වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගබඩාවේ පැවති ජල මීටර් 5 ක වටිනාකම ගිණුම්වල දක්වා නොතිබීම හේතුවෙන් පොදු ගබඩා ශේෂය රු.287,079ක් අඩුවෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට යටවත්ත ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන ගොස් තිබූ අංක 5348900 දරන ගිණුමේ ශේෂය වූ රු.38,957 ක් ගිණුම්වල දක්වා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලීබඩු හා සවිකිරීම් ශේෂය රු.51,000 ක් වැඩියෙන් දැක්වුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 6 ක වටිනාකම රු.16,276,524 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව ඊට වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ රු.173,835 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.8,404,936 ක්වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.572,045 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.62,685,274 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්.

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1893 අංක 9 දරන ගෝඝාතකාගාර ආඥා පනත | |
| (i) 6 වගන්තිය | සභාබල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ගෝඝාතකාගාර වෙළඳ ව්‍යාපාරය සඳහා ලබාදියයුතු ඇප ඔප්පුවක් හෝ ගිවිසුමක් සකස්කර ලබාදී නොතිබුණි. |
| (ii) 9 වගන්තිය | ගෝඝාතකාගාරය සඳහා විධිමත් පරිදි නිකුත් කළ බලපත්‍රයක් නොතිබුණි. |
| (iii) 10 වගන්තිය | 2017 වර්ෂයේදී ගවයින් 108 දෙනෙකු ඝාතනය කර තිබූ නමුත් නිසි බලධරයා වෙත ලබාදියයුතු තොරතුරු ලබාදී නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | |

| | |
|---|---|
| (i) 217 රීතිය | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙනගොස් නොතිබුණි. |
| (ii) 218 රීතිය | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි මංමාවත්, සුසාන භූමි, ක්‍රීඩා පිටි, පොදු ළිං, නළ ළිං සහ වාහන සම්බන්ධයෙන් සභාව ආරම්භයේ සිට මේ දක්වා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 සහ 571 | කර්මාන්ත 15 කට අදාළ රු.289,897ක කල් ඉකුත් වූ අතරැදි මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණ |
| (ඈ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ උපලේඛන A හි "අ" කොටසේ 31 වගන්තිය | සභාවෙන් නිකුත්කළ අංක CPC/YPS/ TL/2017/02 දරන බලපත්‍රය යටතේ සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ගෝඝාතකාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගතයුතු පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය | චක්‍රලේඛයේ දක්වා ඇති ඇමුණුමේ ආකෘතිය පරිදි වාහන සම්බන්ධයෙන් සටහනක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

1.3.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලොරි රථයක එන්ජිම ආශ්‍රිත දෝෂය අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම වෙනුවෙන් පිළිගත් නිලධාරියෙකුගෙන් ලබාගත් ඇස්තමේන්තුවක් හෝ අලුත්වැඩියාව නිසි පරිදි සිදුකළ බවට විධිමත් නිලධාරියෙකුගෙන් ලබාගත් සහතිකයක් නොමැතිව පෞද්ගලික ආයතනයක් වෙත රු.91,302 ක් ගෙවීම්කර තිබුණි.

(ආ) ට්‍රේලරයක් අළුත්වැඩියා කිරීමේදී විස්තරාත්මක ඇස්තමේන්තුවක් හා අලුත්වැඩියාව සිදුකිරීමෙන් පසු විස්තරාත්මක බිල්පතක් ඉදිරිපත්කර නොතිබියදී අලුත්වැඩියාව නිසි පරිදි සිදුකළ බවට කාර්මික නිලධාරි විසින් සහතික කර පෞද්ගලික ආයතනයකට රු.100,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) යතුරුපැදියක් සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් අලුත්වැඩියා සඳහා පිළිවෙළින් රු. 27,040 ක් සහ රු.61,050 ක් ගෙවීම් කර තිබුණද එම අළුත්වැඩියා සඳහා විධිමත් නිලධාරියෙකු විසින් අනුමත කර තිබූ ඇස්තමේන්තුවක් නොතිබුණි.

(ඈ) ලොරි රථය අලුත්වැඩියා කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ප්‍රකාරව අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබානොගෙන පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.418,415ක් ගෙවීම් කර තිබූ අතර අදාළ මුදල් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,166,135 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,310,121 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉක්තු වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,010,200 | 1,074,882 | 1,561,829 | 270,228 | 1,133,000 | 1,107,202 | 1,084,107 | 144,422 |
| (ii) | කුලී | 2,286,506 | - | 814,226 | 14,500 | 2,473,000 | - | 2,666,265 | 84,125 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 395,370 | - | 370,894 | - | 883,050 | - | 880,814 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,820,704 | - | 1,541,696 | 202,714 | 1,441,300 | - | 1,100,430 | 142,924 |

2.2.2 වරිපනම් හා බදු

(අ) අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.30,284 ක හිඟ අක්කර බදු ශේෂයක් විය.

(ආ) කසළ ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කසළ ගාස්තු ශේෂය රු.34,800 ක් විය.

(ඇ) ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල යෝජනා ක්‍රම 5 ක රු.205,205 ක හිඟ ශේෂයක් අයකරගෙන නොතිබුණි.

2.2.3 කුලී

-----

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි කුලී ගාස්තු ශේෂය රු.14,500 ක් විය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.290,500 ක් සහ මුද්දර ගාස්තු රු.9,045,784 ක් විය.

2.3 අධිභාර

--------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂවලදී පැන වූ අධිභාරවලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.32,259 ක අධිභාර මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

---------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 10 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් එවැනි අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-------------------------------------------

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කර්තව්‍යයන් 3 ක් ඉටු කිරීම සඳහා රු. 1,506,580 ක මුදලක් වැයකර තිබුණද, අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

| | කර්තව්‍ය | ඇස්තමේන්තු මුදල | ඉටුකළ ප්‍රමාණයේ වටිනාකම | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | --------- | ---------- | ----------- | ----------- |
| | | රු. | රු. | |
| (i) | ඩන්ගන් පෙර පාසලේ වැසිකිළි පද්ධතිය වැඩිදියුණු කිරීම | 800,895 | 401,877 | i. ප්‍රතිපාදන 2017 ඔක්තෝබර් 19 දින අනුමත වීම මත ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම<br>ii. ඇස්තමේන්තුගත වටිනාකම රු.139,994 ක් වූ වැඩ විෂයයන් 11ක් ඉටුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | iii. ඉටුකර තිබූ වැඩ විෂයයන් 9 ක් ඇස්තමේන්තුගත ප්‍රමාණයන්ට වඩා 20% ත් 60% ත් අතර අඩු ප්‍රමාණයකින් ඉටුකර තිබුණි.<br><br>iv. වැඩ විෂය අංක 24 යටතේ රු.63,556 ක වටිනාකමැති ඇලුමිනියම් දොරවල් යෙදීමට ඇස්තමේන්තුකර තිබූ නමුත් ඒ සඳහා දැව දොරවල් යොදා දැව ආරක්ෂක හෝ තීන්ත ආලේප කිරීමද සිදුකර නොතිබුණි.<br><br>v. ඉදිකිරීමට අපේක්ෂාකර තිබූ වැසිකිළි පද්ධති දෙක වෙනුවට එක් පද්ධතියක් පමණක් ඉදිකර තිබුණි. |
| (ii) | පතිංගස්කොටුව ජල යෝජනා ක්‍රමය අළුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම | 1,292,246 | 687,375 | රු.100,288 ක වටිනාකමින්යුතු වැඩ විෂයයන් 5 ක් ඉටුකර නොතිබුණි. |
| (iii) | මැදියාපොල ජල ව්‍යාපෘතිය | 1,050,421 | 417,328 | වෙන් කළ මුදල්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.
---------------------------------------

2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.3,692,885 ක් වැයකර ඩන්කන්වත්ත පෙර පාසැල හා ළමා උද්‍යානයේ සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදුකර තිබූ නමුත් ව්‍යාපෘතියෙන් ඵලදායී ලෙස ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා විධිමත් සැලැස්මක් සකස් කර පෙර පාසැල සහ ළමා උද්‍යානය ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතුකර නොතිබුණි.

(ඈ) අත්හැර දැමූ කර්තව්‍යයන්
------------------------------

ව්‍යාපෘතිය යෝජනා කිරීම හා එහි කටයුතු ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකිරීම හේතුවෙන්, අඹන්පොල රන්දියදහර ප්‍රජා මූල සංවිධානය සඳහා නල ළිඳක් ඉදිකිරීම හා පොම්ප සැපයීමට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සමාලෝචිත වර්ෂය තුළ ලද රු.700,000 ක ප්‍රතිපාදන මුදලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ "ආ" කොටසේ 27 හා 28 ප්‍රකාරව සභාව පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති භූමිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා 2012 වර්ෂය වන විට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සභා අරමුදල් මඟින් රු.659,062 ක් වැයකර ඉදිකළ ගොඩනැගිල්ල සහ 2016 වර්ෂයේදී රු.700,000 ක් වැයකර ඉදිකළ කොම්පෝස්ට් අංගනය භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයක් සිදු නොකරන අතර එකී ගොඩනැගිලි අපේක්ෂිත පරිදි කසළ කළමනාකරණ අරමුණු ඉටුකර ගැනීමට යොදාගෙන නොතිබුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------

තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 යටතේ සභාව මඟින් මාතෘ හා ළමා සෞඛ්‍ය නංවාලීම, ආහාර නිෂ්පාදන පරීක්ෂාව, දිළිඳුකම පිටුදැකීම හා ජල මූලාශ්‍ර සංරක්ෂණය යන තිරසාර සංවර්ධන අරමුණු සහ හඳුනාගත් ඉලක්ක ළඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා වූ ක්‍රමවේදයන් හඳුනාගෙන තිබුණද, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම, අඩු ආදායම්ලාභී සභාවක් වීම, පුහුණු සඳහා ප්‍රතිපාදන අඩුවීම සහ පුහුණු සම්පත්දායකයින් හා ආයතන හඳුනාගත නොහැකි වීම යන අඩුපාඩු හේතුවෙන් එකී අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාව සිය බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ හා ආරක්ෂා කිරීමේ පොදු පරිපාලන අධිකාරිය ලෙස කටයුතු කළ යුතු වුවත් සභා බල ප්‍රදේශය තුළ සභාව මඟින් නඩත්තු කරන ජල යෝජනා ක්‍රම 5 න් එකක ජල යෝග්‍යතාවය පරීක්ෂා කර නොතිබුණි. තවද ජල ව්‍යාපෘති 4 කින් බෙදාහරිනු ලබන ජලය සම්බන්ධයෙන් වූ යෝග්‍යතා පරීක්ෂණ වාර්තා අනුව ජලය බීමට නුසුදුසු තත්ත්වයේ පැවති නමුත් පිරිපහදු ක්‍රියාවලියකට යොමු වී එම නුසුදුසු භාවයට පිළියම් යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා අරමුදලට බැරකළයුතු රු.148,968 ක් වටිනාකමින් යුතු ලැබීම් 8 ක් ආදායමට නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීම යටතේ වැඩ නිමකළ කර්මාන්ත 4 ක් වෙනුවෙන් රු.3,473,050 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදලින් ගෙවීම් කර තිබුණද, එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

සේවක පුරප්පාඩු හා අතිරික්ත

------------------------------

තනතුරු 7 කට අදාළව සේවකයින් 15 දෙනෙකුගේ ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර, මෙම සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවේ වැඩකටයුතුවලට බාධා ඇති වී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 94 කින් 60 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත්, අනුකූලතා සහතික නිකුත්කර තිබුණේ අයදුම්පත් 05 ක් සඳහා පමණි.

(ආ) සභාබල ප්‍රදේශය තුළ වරිපනම් බදු අය කිරීමක් සිදු නොකරන අතර, 2013 ජූලි 09 දිනැති අංක සීපීසී/ඒසීඑල්ජී/එම්7/7/1/1/9 දරන මාතලේ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපියක් මඟින් දක්වා තිබූ සභා බලප්‍රදේශයේ පවතින අඩුපාඩු සකස්කර වරිපනම් බදු අයකිරීමට අදාළ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටද, කටයුතු කර නොතිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

--------------------------

3.5.1 පවරා නොගත් වත්කම්

------------------------

මවුන්ටන් වීව් ගාර්ඩින් ඉඩම් ව්‍යාපෘතිය රතලවැව යටතේ ඉදිකර තිබූ රු.2,052,063 ක් වටිනා ජල ව්‍යාපෘතිය සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

3.5.2 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පතිංගස්කොටුව ජල ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයට පෙර මිලදීගෙන තිබූ රු.66,780 ක වටිනාකමින්යුතු මි.මී.90 x මි.මී.20 ප්‍රමාණයේ ලොකු සැඩල් 280 ක් ප්‍රයෝජනයකට නොගෙන වර්ෂ 10 කට වැඩි කාලයක් ගබඩාවේ රඳවා තිබුණි.

3.6 ප්‍රසම්පාදනය

------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 සහ 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් නොකර 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 2,508,652 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.6.2 සැපයීම් හා සේවා

------------------

සමාලේචිත වර්ෂය තුළ සිදුකර තිබූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) සහ 2.8.4 වගන්තිය ප්‍රකාරව තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර නොතිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 (අ) වගන්තිය ප්‍රකාරව කමිටු රැස්වීම් වාර්තා පැවැත්වීම හා ප්‍රසම්පාදන ලේඛනය විධිමත් පරිදි නඩත්තු කර නොතිබුණි.

(ආ) රු. 529,795 ක් වූ මිලදී ගැනීම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තිය ප්‍රකාරව කෙටි සහ පැහැදිලි පිරිවිතර සකස් කර නොතිබුණි.

(ඇ) අදාළ තීරණ සාධාරනීකරණය කිරීමට පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමකින් තොරව අවම මිල ප්‍රතික්ෂේපකර වැඩි මිලක් යටතේ රු. 186,720 ක් වූ පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් සහ ප්ලාස්ටික් පුටු මිලදී ගැනීමේදී 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති 178(9) (4) හා ප්‍රසම්පාදන අත්පොතේ 5.6, 2.11.3 හා සබැඳි ආකෘති (5), (10), (11) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 17 කට අදාළ රු.22,366,084 ක්වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණි.

(ආ) ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 45 සිට සියයට 203 අතර පරාසයක විචලනයක් පැවතුණි.

(ඇ) වැය විෂයයන් 40 ක් සඳහා සලසා තිබූ රු.14,310,400 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) වැය විෂයයන් 26 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය සහ වියදම අතර, සියයට 45 සිට සියයට 98 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය හා 2014 අගෝස්තු 01 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සීපීසී/සීඑම්සී/1/6 දරන ලිපිය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වියයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් කමිටුවක් පමණක් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ----------- | | -------------- |
| (අ) | වත්කම් කළමනාකරණය | (i) | ගිණුම්ගත නොකිරීම |
| | | (ii) | පවරා නොගැනීම |
| | | (iii) | ඌන උපයෝජිතව හා නිශ්ක්‍රියව පැවතීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | | පුරප්පාඩු සම්පූර්ණකර නොගැනීම. |
| (ඇ) | ව්‍යාපෘති / කොන්ත්‍රාත් | (i) | ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යනයන් සිදු නොකිරීම. |
| | | (ii) | අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි නිම නොකිරීම. |
| (ඈ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබීම |
| | | (ii) | ආදායම් ඉලක්ක සපුරා නොගැනීම. |

පටුන

--------


| අනු අංකය | විස්තරය | පිටු අංකය |
| --- | --- | --- |
| 01 | කාර්යභාර නියමතා පත්‍රය | 01 |
| 02 | පොදු ලෙජරය,ඒකාබද්ධ ලැබීම් සහ ගෙවීම් විශ්ලේෂණය | 02 – 29 |
| 03 | පොදු ජ'නලය | 30 – 64 |
| 04 | ශේෂ පිරික්ෂුම | 65 |
| 05 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 66 |
| 06 | හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය | 67 |
| 07 | මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් | 68 - 69 |
| 08 | ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් | 70 - 73 |
| 09 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 74 |
| 10 | දැක්ම මෙහෙවර ප්‍රකාශය,පොදු තොරතුරු සහ ආදායම් වියදම විශ්ලේෂණය සහ ගිණුම ඉදිරිපත් කිරීම | 75 - 82 |
| 11 | ගිණුමට අදාල උප ලේඛන | 83 - 158 |
| 12 | සාකච්ඡා සටහන | 159 - 161 |
| 13 | පරීක්ෂණ ලැයිස්තුව | 162 - 171 |
| 14 | කෙටුම්පත් කරන ලද වාර්තාව | 172 - 203 |
| 15 | වි.අධි. සංශෝධනය කළ වාර්තාව | 204 - 221 |
| 16 | කෙටුම්පත් වාර්තාව | 222 - 239 |
| 17 | සභාවෙන්ලබාගත් තොරතුරු | 240 - 264 |
| 18 | පිළිතුරු | 265 - 294 |
| 19 | නිරීක්ෂණ වාර්තාව | 295 - 308 |
| 20 | මතයට එළඹීමට අදාල තොරතුරු | 309 - 312 |